* සියලු ම හිමිකම් ඇවිරිණි

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2023 අගෝස්තු

## (103) ආර්ථික විද්‍යාව

(**Economics**)

**අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) **දී ඇති කාලය** : පැය 03 යි.
(2) **සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.**
(3) ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්**, ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.
(4) ගණනය කිරීම සහ පෙරවැඩ අමුණන, උපකල්පන කිසිවක් ඇතොත, ඒවා පැහැදිලිව දක්වන්න.
(5) වැඩසටහන් ගතකිරීම් කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.
(6) **ප්‍රස්තාර කොළ** සපයනු ලැබේ.
(7) අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සැම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුකත වේ. කළ යුතු ක්‍රියා පරීකෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.
(8) ලකුණු 100 ය.

---

### A කොටස

(මුළු ලකුණු 40)

**අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරා ගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.**

1.1) පහත ඒවා අතරින් සාර්ව ආර්ථික විද්‍යාවට අයත් සංකල්පය වන්නේ?

1) කටුම්භ ඉල්ලුම
2) නිෂ්පාදකයෙකුගේ සැපයුම
3) රජය විසින් බදු පැනවීම
4) විදේශ විනිමය අනුපාතය

1.2) යථානුරූපී ආර්ථික ප්‍රකාශ සම්බන්ධයෙන් පහත දැ සලකා බලන්න.

a) එය තාර්කික පදනමකින් ඉදිරිපත් කරයි
b) විටින් විට වෙනස් වන ප්‍රකාශයන් වේ
c) පවත්නා දත්ත , තොරතුරු මත පදනම් වේ
d) අභියෝගයට ලක් කල හැකි ප්‍රකාශ වේ

JMC vLearning "your virtual learning partner"

ඉහත ප්‍රකාශන අතරින් යථානුරූපී ප්‍රකාශයක පමණක් ඇතුළත් ලක්ෂණ අඩංගු වන්නේ

1) a, b හා c
2) a, b හා d
3) a හා C
4) a හා d


1.3) කිසියම් කාලයක් තුළ යම්කිසි භාණ්ඩයකින් අමතර ඒකකයක් පරිභෝජනය කිරීමෙන් කිසියම් පුද්ගලයෙකුට ලැබෙන අතිරේක තෘප්තිය හඳුන්වනු ලබන්නේ

1) මුළු උපයෝගීතාවය ලෙසයි.
2) ආන්තික පිරිවැය ලෙසයි.
3) ආන්තික උපයෝගීතාවය ලෙසයි.
4) මුළු පිරිවැය ලෙසයි.

1.4) පහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක් ද?

1) භාණ්ඩයක් පරිභෝජනය කිරීමෙන් ලැබෙන තෘප්ති මට්ටම මැනිය නොහැකි බවට සංඛ්‍යා සුචක උපයෝගිතා න්‍යායෙන් (the theory of Cardinal Utility) උපකල්පනය කෙරේ.
2) උපයෝගීතාවය මැතිය හැකි බවට ක්‍රම සූචක උපයෝගිතා න්‍යායෙන් (the theory of Ordinal Utility) උපකල්පනය කෙරේ.
3) භාණ්ඩ හා සේවා පරිභෝජනය කිරීමෙන් ලැබෙන ආන්තික තෘප්තිය, මුළු උපයෝගීතාවය වේ.
4) කිසියම් පුද්ගලයෙකු දෙන ලද කාල සීමාවක් තුළ අතිරේක භාණ්ඩ ඒකකයක් පරිභෝජනය කිරීමෙන් ලැබෙන අතිරේක තෘප්තිය, ආන්තික උපයෝගීතාවය වේ.

1.5) A භාණ්ඩයට අදාලව, පහත සඳහන් ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර ඔබ වෙත ලබාදී ඇත




A භාණ්ඩය වෙළෙඳපොළේ විකිණිය හැකි උපරිම මිල රු.100/- කි. පාරිභෝගික අතිරික්තය වන්නේ

1) රු.2,500/- කි.
2) රු.5,000/- කි.
3) රු.1,250/- කි.
4) රු.1,000/- කි.

iMCVLearning "virtual learning partner"

1.6) යෙදවුම් වැඩි කිරීමට සමානුපාතිකව අඩු ප්‍රමාණයකින් මුළු නිමැවුම වැඩි වන්නේ නම්, ආයතනය අත්විදිනු ලබන්නේ

1) වැඩිවන පරිමාණුකූල ඵලයි.
2) අඩුවන පරිමාණුකූල ඵලයි.
3) හීනවන ආන්තික ඵලයි.
4) ස්ථාවර පරිමාණුකූල ඵලයි.

1.7) පහත සඳහන් ඒවා අතුරෙන්, ඒකාධිකාරී තරඟයේ ලක්ෂණයක් නොවන්නේ කුමක්ද?

1) අබාධ පිවිසුම සහ පිටවීම.
2) නිෂ්පාදන සාධකවල පූර්ණ සංචලතාවය.
3) සමපාතීය භාණ්ඩ තිබීම.
4) දිගු කාලයේදී ප්‍රාමාණික ලාභ ලැබීම.

1.8) පුළුල් මුදල් සැපයුමට අනේවාසික විදේශ ව්‍යවහාර ගිණුම්වල ඇති කාලීන සහ ඉතුරුම් තැන්පතු ප්‍රමාණයෙන් 50% ක් හා විදේශ ව්‍යවහාර බැංකු ඒකකවල ඇති නේවාසිකයන් සතු කාලීන හා ඉතුරුම් තැන්පතු ප්‍රමාණය එකතු වීමෙන් සෑදෙන මුදල් සැපයුම හඳුන්වනු ලබන්නේ,

1) පටු මුදල් සැපයුම ලෙසයි.
2) මුදල් පදනම ලෙසයි.
3) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ලෙසයි.
4) වඩාත් පුළුල් මුදල් සැපයුම ලෙසයි.

1.9) පහත සඳහන් ඒවා අතුරෙන්, ගෙවුම් ශේෂ ලේඛනයේ මූල්‍ය ගිණුමේ ඇතුළත් වන්නේ කුමක්ද?

1) සෘජු විදේශ ආයෝජන.
2) භාණ්ඩ අපනයන.
3) රාජ්‍ය ප්‍රදාන.
4) භාණ්ඩ ආනයන.

1.10) පහත සඳහන් ඒවා අතුරෙන්, මානව සංවර්ධනයේ පැතිකඩය තුලට ඇතුළත් නොවන අයිතමයක් වන්නේ,

1) දේශපාලන ස්වාධීන බවයි.
2) ආර්ථික ස්ථායිතාවයයි.
3) සමානාත්මතාවයයි.
4) අධ්‍යාපනයයි.

JMC vLearning "your virtual learning partner"

අංක 1.11 සහ 1.12 ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුල දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.

1.11) භාණ්ඩ සහ සේවාවල මිල ගණන් ඉහළ යනවිට, මුදලේ වටිනාකම ..................................
(ඉහළ යනු ලැබේ / පහළ යනු ලැබේ.

1.12) කාර්යක්ෂමතාවය සහ ස්ථායිතාවය, තිරසාර සංවර්ධනයේ ............................................
(ආර්ථික / සමාජීය) පැතිකඩයේ උප-සංරචකයන් වේ.

අංක 1.13 සහ 1.15 ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍ය** දැයි දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.

1.13) වෙළෙඳපොළෙහි ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් විශාල පිරිසක් සිටින වෙළෙඳපොළ ව්‍යුහයක් කතිපයාධිකාරී (oligopoly) වෙළෙඳ පොළක් වේ.

1.14) සැපයුම් නීතියට අනුව, භාණ්ඩයක මිල සහ එම භාණ්ඩයේ සැපයුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම (සෘණ) සම්බන්ධතාවයක් පවතී.

1.15) කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේදී, සාමාන්‍ය පිරිවැය වක්‍රයේ (Average Cost Curve) අවම ලක්ෂයේදී, ආන්තික පිරිවැය [Marginal Cost (MC)], සාමාන්‍ය පිරිවැයට [Average Cost (AC)] සමාන වේ.

අංක 1.16 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.

1.16) රජයේ හිඟ අයවැයක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

1.17) රජය විසින් මිල පාලන පැනවීම සඳහා ඇති හේතු දෙකක්(02) සඳහන් කරන්න.

1.18) මුදලට ඇති ඉල්ලුම තීරණය කරන හේතු දෙකක්(02) සඳහන් කරන්න.

1.19) මුළු නිෂ්පාදිතය [Total Product (TP)] සහ සාමාන්‍ය නිෂ්පාදිතය [Average Product (AP)] අතර වෙනස සඳහන් කරන්න.

1.20) මානව සංවර්ධන පැතිකඩය තුළ ඇතුළත් අයිතම දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

A කොටසේ අවසානය

JMC vLearning
your virtual learning partner

**B කොටස**
(මුළු ලකුණු 40)

## 02 වන ප්‍රශ්නය

a) මිශ්‍ර ආර්ථික ක්‍රමයක (Mixed Economic System) ප්‍රධාන ලක්ෂණ තුනක් (03) ලැයිස්තුගත කරන්න.
(ලකුණු 03)

b) වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය (Market Economic System) මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගත්තේ කෙසේදැයි යන්න පැහැදිලි කරන්න.
(ලකුණු 04)

c) අවශ්‍යතා සහ වුවමනා අතර වෙනස, එකිනෙකට උදාහරණයක්ද සමඟ, පැහැදිලි කරන්න.
ලකුණු 03)
(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

(a) B නිෂ්පාදිතයට අදාලව ඉල්ලුම් සමීකරණය (Qd) සහ සැපයුම් සමීකරණය (Qs) පහත පරිදි වේ.

$$Qd = 160 - 10p$$
$$Qs = 30p$$

ඉහත සඳහන් තොරතුරු භාවිත කරමින්,

**ඔබ විසින් කළ යුතු දෑ**

i. ප්‍රස්තාරයක් භාවිතයෙන් සමතුලිත මිල සහ ප්‍රමාණය හඳුනා දක්වන්න. (ලකුණු 04)
ii. නිෂ්පාදකයාගේ අතිරික්තය (surplus) ගණනය කරන්න. (ලකුණු 02)

(b) රජය විසින් වක්‍ර බද්දක් ලෙස භාණ්ඩයක් සඳහා ඒකක බද්දක් පැනවීමේ ප්‍රතිවිපාක පැහැදිලි කරන්න.
(ලකුණු 04)
(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

(a) ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය සහ පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය අතර වෙනස පැහැදිලි කරන්න.
(ලකුණු 04)

(b) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය ප්‍රතිපත්තියේ ගුණාත්මක පාලනයන් දෙකක්(02) සඳහන් කරන්න.
(ලකුණු 02)

JMC vLearning "your virtual learning partner"

(c)" ශ්‍රී ලංකාව මුහුණ දී සිටින වත්මත් ආර්ථික අර්බුදකාරී තත්ත්වය මගහරවා ගැනීම සඳහා සිය මුල්‍ය ප්‍රතිපත්තිය දැඩි කරන ලෙස ජාත්‍යන්තර මුල්‍ය අරමුදල [International Monitory Fund (IMF)] ශ්‍රී ලංකාවට යෝජනා කරයි.”

**ඔබ විසින් කළ යුතු දෑ**

ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදයෙන් මිදීම / අඩු කිරීම සඳහා මුල්‍ය ප්‍රතිපත්තිය බලපානු ලබන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

a) “රටක් ආනයන පාලනය කිරීම සඳහා තීරුබදු (tariffs) යොදාගනී”.
රටක් ජාත්‍යන්තර වෙළඳාම පාලනය සඳහා භාවිත කරන වෙනත් ක්‍රම දෙකක්(02) සඳහන් කරන්න.

(ලකුණු 02)

b) X සහ Y යන රටවල් දෙක, සහල් සහ තිරිඟු යන නිෂ්පාදිත දෙකම නිෂ්පාදනය කරයි. මෙම රටවල් දෙක එක් ශ්‍රම ඒකකයකින් නිපදවනු ලබන සහල් සහ තිරිඟු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ

| නිෂ්පාදිතය / රට | සහල් (කිලෝ ග්‍රෑම්) | තිරිඟු (කිලෝ ග්‍රෑම්) |
|---|---|---|
| X | 8 | 2 |
| Y | 4 | 4 |

i. එක් එක් නිෂ්පාදිතය නිෂ්පාදනයේදී, නිරපේක්ෂ වාසියක් (absolute advantage) ඇත්තේ කුමන රටකටද යන්න සඳහන් කරන්න.

(ලකුණු 02)

ii. එක් එක් නිෂ්පාදිතය නිෂ්පාදනයේදී, සාපේක්ෂ වාසියක් (comparative advantage) ඇත්තේ කුමන රටකටද යන්න සඳහන් කරන්න. (ගණනය කිරීම් සමඟ තහවුරු කරන්න).

(ලකුණු 04)

(c) ගෙවුම් ශේෂ ලේඛණයේ ඇතුළත් ජංගම ගිණුමෙහි අඩංගු සංරචක (components) දෙකක්(02) සඳහන් කරන්න.

(ලකුණු 02)

(මුළු ලකුණු 10)

B කොටසේ අවසානය

## C කොටස
(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

(A) වසරක කාලයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් උපකල්පිත දත්ත ඔබ වෙත සපයා ඇත.

| | රු. මිලියන |
|---|---:|
| පෞද්ගලික පරිභෝජන වියදම් | 600 |
| රජයේ පරිභෝජන වියදම් | 500 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 400 |
| තොග වෙනස්වීම් | 200 |
| අපනයන | 400 |
| ආනයන | 250 |
| විදේශ ශුද්ධ සාධක ආදායම (විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම) | -100 |

**ඔබ විසින් කළ යුතු දෑ**

වියදම් ප්‍රවේශය (expenditure approach) භාවිත කරමින්, පහත සඳහන් දෑ ගණනය කරන්න.

(a) වෙළෙඳපොළ මිලට දළ දේශීය වියදම [Gross Domestic Expenditure (GDE)] (ලකුණු 05)
(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP) (ලකුණු 03)
(c) වෙළෙඳපොළ මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI) (ලකුණු 02)

(B) (a) රජයේ පිස්කල් ප්‍රතිපත්තිය (Fiscal Policy) සහ මුල්‍ය ප්‍රතිපත්තිය (Monetary Policy) අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(b)අයවැය හිඟය (budget deficit) යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 02)

JMC vLearning "your virtual learning partner"

(C) (a) වෙළෙඳපොළ ආර්ථිකයක් තුළ සම්පත් බෙදී යාමේ අකාර්යක්ෂමතාවයත් වැළැක්වීම (inefficiencies of resource allocation) සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග (measures) දෙකක්(02) සඳහන් කරන්න.

(ලකුණු 02)

(b) රජයේ අසමත්වීම (failure of the government) කෙරෙහි බලපාන හේතු දෙකක්(02) සඳහන් කරන්න.

(ලකුණු 02)

(මුළු ලකුණු 20)

C කොටසේ අවසානය

JMC vLearning
"your virtual learning partner"